## ජාතික චිත්‍රපට සංවර්ධන අරමුදල - 2018

-------------------------------------------------

### 1.1 මතය

--------

ජාතික චිත්‍රපට සංවර්ධන අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

ජාතික චිත්‍රපට සංවර්ධන අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

----------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

---------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

### 1.4 විගණන විෂය පථය මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන

නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව

**1.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**
**-----------------------------------------------------------------------------------**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| **නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| ---------------------------------- | --------------------- | -------------------- | --------------- |
| (අ) 1999 ජුනි 17 දින මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති ජාතික චිත්‍රපට ප්‍රතිපත්තිය හා ඒ පිළිබඳ මාර්ගෝපදේශයේ 6.5 වගන්තිය | ආයෝජන මණ්ඩල රෙගුලාසි යටතේ ඉදිකරන ලද සිනමා සංකීර්ණවල ප්‍රදර්ශනය කරනු ලබන එක් එක් ආනයනික චිත්‍රපටයක ප්‍රවේශ පත්‍රයකින් රු.2.25 හෝ මුළු ප්‍රවේශපත් ආදායමින් සියයට 2.25 ක් හෝ යන දෙකින් කවරක් හෝ වැඩි මුදල ,ජාතික චිත්‍රපට සංවර්ධන අරමුදලට ලැබිය යුතු වුවත් 2001 වර්ෂයේ ඉදිකරන ලද මරදාන සිනේසිටි (Cine City) සිනමා සංකීර්ණයෙන් එලෙස අයවිය යුතු මුදල ගණනය කර අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සඳහන් කර ඇති ක්‍රමවේදය ඇත්තේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති මාර්ගෝපදේශයේය. ඒ අනුව කටයුතු කර නොමැත. | චිත්‍රපට ප්‍රතිපත්තිය හා ඒ පිළිබඳ මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |
| (ආ) 1996 ඔක්තෝබර් 24දින අංක 9/946දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ 1996 අංක 1 දරන ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා (විවිධ ගාස්තු) නියෝග | | | |

| | | | |
|---|---|---|---|
| (i) 4 වගන්තිය | ආනයනය කරනු ලැබූ චිත්‍රපටයක් ප්‍රදර්ශනය කරන අවස්ථාවක දී අයකරන ගාස්තුවලට (Levy) අමතරව " යූ" ගණයේ චිත්‍රපටියක් සඳහා ප්‍රවේශ පත්‍රයකින් එක් රුපියලයක් ද "එක්ස්" ගණයේ සහ "වැඩිහිටියන්ට වඩා සුදුසුයි" යන ගණවල චිත්‍රපට සඳහා ප්‍රවේශ පත්‍රයකින් රුපියල් තුනක් අයකර ගත යුතුයි. එම මුදල් සිනමා ශාලාවේ අයිතිකරු හෝ බදු ගැනුම්කරු විසින් අරමුදලට ප්‍රේෂණය කර ලැබිය යුතු වුවත් වගකිව යුතු පාර්ශවයන් විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | සටහන් කර ඇති පරිදි මුදල් අයකිරීමක් සිදුකර නොමැත. | චිත්‍රපට සංස්ථාවේ (විවිධ ගාස්තු) නියෝග යටතේ අමතර ගාස්තු අයකර ගත යුතු බව. |
| (ii) 5(i) වගන්තිය | ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය හා සභාපතිවරයා ඇතුලුව නම් කරනු ලබන සාමාජිකයින් දෙදෙනෙකුගෙන් අරමුදලේ පාලක මණ්ඩලය සමන්විත විය යුතු වුවද, ඒ අනුව පාලක මණ්ඩලය පත්කර නොතිබුණි. | 2019 වර්ෂයේ පාලක මණ්ඩලයක් පත් කර ඇත. | පාලක මණ්ඩලය නියමිත පරිදි පත්කර අරමුදලේ කටයුතු සිදුකළ යුතු බව. |
| (iii) 2 (4) (i) (ඉ) වගන්තිය | චිත්‍රපටිවල උසස් ප්‍රමිතීන් සහතික කිරීම සඳහා චිත්‍රපට නිෂ්පාදනය කිරීමට සහ ප්‍රදර්ශනය කිරීමට අවශ්‍ය වන උපකරණ සැපයීම සඳහා වර්ෂ 08 ක කාලයක සිට කටයුතු කර නොතිබුණි. | නිරීක්ෂණ නිවැරදිය. | චිත්‍රපට ප්‍රමිතිය උසස් කිරීම සඳහා නිෂ්පාදනයට හා ප්‍රදර්ශනය කිරීමට අවශ්‍ය උපකරණ සැපයීම කළ යුතු බව. |
| (iv) 2 (4) (i) (ඊ) වගන්තිය | චිත්‍රපට කර්මාන්තයේ නියැලී සිටින කලාකරුවන්ට සහ කාර්මික ශිල්පීන්ට ශිෂ්‍යත්ව ලබාදීම හෝ පුහුණු වැඩසටහන් ඇති කිරීම උදෙසා අරමුදල කටයුතු කර නොතිබුණි. | පාලක මණ්ඩලය පත් කිරීමට ප්‍රමාද වූ හෙයින් අරමුදලේ කටයුතු සිදුකිරීමට නොහැකි විය. | කලාකරුවන්ට හා කාර්මික ශිල්පීන්ට ශිෂ්‍යත්ව හෝ පුහුණු වැඩසටහන් ඇති කිරීමට කටයුතු කළ යුතු බව. |
| (v) 2 (4) (i) (උ) වගන්තිය | උසස් තත්ත්වයේ කලාත්මක චිත්‍රපට මුළුමනින්ම නිෂ්පාදනය කිරීම සඳහා තිර රචනා ඇගයීමේ කමිටුව විසින් අනුමත කරනු ලැබූ තිර රචනා හෝ එවැනි චිත්‍රපට නිෂ්පාදනය කිරීමේ කාර්යය සඳහා ලබාගත හැකි ප්‍රභවයකින් විශේෂ උපකරණ කුලියට ලබාගැනීම පිණිස අධ්‍යක්ෂවරුන්ට ණය මුදල් දීම මගින් චිත්‍රපට නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම සඳහා වර්ෂ ගණනාවක සිට කටයුතු කර නොතිබුණි. | -එම-. | චිත්‍රපට නිෂ්පාදනය කිරීමට අවශ්‍ය උපකරණ කුලියට ලබා ගැනීමට අධ්‍යක්ෂවරුන්ට ණය මුදල් ලබා දී එවැනි නිෂ්පාදන ප්‍රවර්ධනය කටයුතු කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (vi) 2 (4) (i) (ඌ) වගන්තිය | වර්ෂ 05 ක් හෝ ඊට වැඩි කාලයක් නොකඩවා දේශීය කර්මාන්තයේ නියැලී සිටින සහ චිත්‍රපට දහයකට අඩු නොවන ගණනක කටයුතු සම්පූර්ණ කර ඇති වෘත්තීය කාර්මික ශිල්පීන්ට තමන්ගේ නිපුනතා වැඩිකර ගැනීමට සහ දියුණුකර ගැනීමට ණය මුදල් නිකුත් කිරීමට 2013 වර්ෂයේ සිට කටයුතු කර තිබුණි. | -එම- | වෘත්තිය කාර්මික ශිල්පීන්ට තම නිපුණතා වැඩිකර ගැනීමට හා දියුණු කර ගැනීමට ණය ලබා දිය යුතු බව. |
| (vii) 6 (ඇ) වගන්තිය | ණය මුදල් ආපසු ගෙවීම ප්‍රමාද වන්නේ නම් ඒ සඳහා අයවිය යුතු අධිභාර පාලක මණ්ඩලය විසින් නිශ්චය කර අයකර ගතයුතු වුවත්, 2013 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා සිනමාශාලා හිමියන් වෙත ප්‍රදානය කර තිබූ රු.72,535,872 ක ණය මුදල් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ණය මුදල් අයකර ගැනීමට අපහසුතාවයක් පවතින අතර ණය මුදල් අයකර ගැනීමට හැකි වුවහොත් අධිභාර අයකර ගැනීමට කටයුතු කරමි. | ණය මුදල් ආපසු ගෙවීම ප්‍රමාද වන්නේ නම් අයවිය යුතු අධිභාර පාලක මණ්ඩලය විසින් පනවා අයකර ගැනීමට කටයුතු කළ යුතු බව. |
| (ඇ) 2015 ඔක්තෝබර් 23 දිනැති අංක 3/2015 දරන භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛය | 2013 වර්ෂයේ මහජන බැංකුවේ ආරම්භ කර තිබූ ජංගම ගිණුම 2018 දෙසැම්බර් 31 දින වන විටත් අක්‍රියව පැවතුණු අතර එම ජංගම ගිණුම වසා දැමීමට කටයුතු කර නොතිබුණි | ගිණුම විවෘත කරනු ලැබුවේ චිත්‍රපට නිෂ්පාදනය සඳහා ණය පහසුකම් සැලසීමටය. ඉදිරියේදී ණය පහසුකම් සැපයීමට බලපොරොත්තු වේ.එවිට ගිණුමද ක්‍රියාත්මක වේ. | දීර්ඝ කාලයක සිට අක්‍රියව පවතින ජංගම ගිණුම වසා දැමිය යුතු බව. |
| (ඈ) 2003 ජුනි 02 දිනැති හා අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් එම මූල්‍ය ප්‍රකාශන මාස 09 දින 05 ක ප්‍රමාදයකින් පසුව 2019 නොවැම්බර් 05 දින ඉදිරිපත් කර තිබුණි. | පාලක මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමට ප්‍රමාද විය. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කළ යුතු බව. |

**2. මූල්‍ය සමාලෝචනය**
**-----------------------**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**
**----------------**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 11,720,551 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 8,798,358 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 2,922,193 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට විදේශ කාර්මික ශිල්පීන් සඳහා ලැබීම් ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ ක්‍රියාකාරකම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) සමාලෝචිත වර්ෂය අවසාන වනවිට වර්ෂ 5 සිට වර්ෂ 24 ක් දක්වා කාල පරාසයක සිට පැවත එන රු. 67,001,194 ක් වූ ණයගැති ශේෂ අයකර ගත නොහැකි ණය ලෙස හඳුනාගෙන තිබුණු අතර, එම ණය ශේෂ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි . | අයකර ගැනීමට කටයුතු කලද කාලාවරෝදයට හසුවීම සහ සිනමාකරුවන්ගේ විරෝදය මත ණය අයකර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගැනීමට නොහැකි විය. නමුත් වර්තමානයේ ණය අයකර ගැනීම සඳහා විධිමත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වේ. | ණය මුදල් අයකර ගැනීමට විධිමත් වැඩ පිළිවෙළක් සකස් කර ක්‍රියාත්මක කළ යුතු බව. |
| (ආ) අරමුදලෙහි ප්‍රධාන ආදායම් මාර්ගය වන චිත්‍රපට කුලී දායකත්වය ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාවෙන් අයකර ගත යුතු වුවත්, 2003 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා මෙම මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.තවද 2018 දෙසැම්බර් 31 දින වනවිට අයවිය යුතු හිඟ මුදල රු.24,470,052 ක් විය . | සංස්ථාවේ පැවති මූල්‍ය අර්බුදය නිසා ඉල්ලීම් කර නැත. මෙම වර්ෂයේදී ඉල්ලීම් කිරීමට කටයුතු කරමි. | චිත්‍රපට සංස්ථාවෙන් චිත්‍රපට කුලී දායකත්වය අයකර ගැනීමට කටයුතු කළ යුතු බව. |
| (ඇ) 2001හා 2002 වර්ෂවලදී ෆිල්ම් ලංකා නැමති සමාගමට මරදාන සිනේසිටි සිනමා සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු හා උපකරණ මිලට ගැනීම සඳහා ලබා දී තිබූ රු.මිලියන 8.5 ක ණය මුදල, ගිවිසුම් ප්‍රකාරව අයකර ගැනීමට අපොහොසත් වී තිබූ අතර, 2018 දෙසැම්බර් 31 දින වනවිට තවදුරටත් රු.1,457,319 ක් අයකරගත යුතුව පැවතුණි. මෙම ණය මුදල සඳහා 2006 වර්ෂය දක්වා ලැබිය යුතු පොලී වටිනාකම රු.4,064,958 ක ලෙස ගණනය කර තිබූ අතර, ඉන් පසු වර්ෂ සඳහා ලැබිය යුතු ණය පොලී ප්‍රමාණය හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ආයෝජන මණ්ඩලයේ ස්ථාපිත සිනමාශාලාවක් බැවින් පොලී ගෙවීම් නොකරන බැවින් පොලිය ගිණුම්ගත කර නොමැත. වාරික මුදල ගෙවීම් කරනු ඇත. | සිනේසිටි සිනමා සංකීර්ණය ඉදිකිරීමට අදාළ ණය ගිවිසුම ප්‍රකාරව 2019 දක්වා පොලිය අයකර ගැනීමට කටයුතු කළ යුතු බව. |
| (ඈ) වැකන්ද වලව්ව චිත්‍රපටයේ නිෂ්පාදන කටයුතු සඳහා ලබා දී තිබුණු ණය මුදල් හා ඊට අදාල පොලිය 2018 දෙසැම්බර් 31 දිනට රු. 3,525,795 ක් වූ අතර එම චිත්‍රපටයේ අයිතිය ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව සතු වුවද වරින් වර මෙම චිත්‍රපටය රූපවාහිනිය මගින් ප්‍රදර්ශනය කර තිබුණි. කෙසේ වෙතත් එම ප්‍රදර්ශන ආදායම චිත්‍රපට සංවර්ධන අරමුදලට ලබාගෙන නොතිබුණි | නිරීක්ෂණ නිවැරදිය. | චිත්‍රපට විද්‍යුත් මාධ්‍ය මගින් පෙන්වීමේදි ඒ සඳහා අනුමැතිය හා ප්‍රදර්ශන කුලී ආදායම සංවර්ධන අරමුදලට ලබා ගත යුතු බව. |

**3.2 අරමුදල් ඌන උපයෝජනය**

**-----------------------------------**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ------------------------- | --------------------- | ------------------- |
| අරමුදල සතු බැංකු ජංගම ගිණුමේ 2018 වර්ෂයේ සාමාන්‍ය මාසික ශේෂය රු.මිලියන 3.3 ක් වූ අතර එම මුදල් ඵලදායී ලෙස කෙටි කාලීනව ආයෝජනය කර අමතර ආදායමක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පාලක මණ්ඩලය පත් කිරීම ප්‍රමාද වීම මත අතිරික්ත මුදල් ආයෝජනය කිරීමට නොහැකි විය. | කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා අදාල මුදල් රඳවාගෙන ඉතිරි මුදල් කෙටිකාලීනව ආයෝජනය කළ යුතු බව. |